ආඛ්‍යාන narrations
**Volume 01 | Issue 02 | July – December 2016 | Article 03**
**ISBN 2478-0642**

On-line Refereed Journal of the Center for Indigenous Knowledge and Community Studies
Sabaragamuwa University of Sri Lanka

Follow this and additional works at: www.sab.ac.lk
e-mail: akyanaeditor@ssl.sab.ac.lk

ISSN 2478-0642

**Recommended Citation**
Dehigama, Kanchana (2016) " වැදි බව හා සිංහල බව අතර අනන්‍යතා දෝලනයන් පිළිබඳ සමාජ මානව විද්‍යාත්මක අධ්‍යයනයක්". *ආඛ්‍යාන* : Vol. 01: Iss. 2, Article 03.
Available at: www.sab.ac.lk

# වැදි බව හා සිංහල බව අතර අනන්‍යතා දෝලනයන් පිළිබඳ සමාජ මානව විද්‍යාත්මක අධ්‍යයනයක්[3]

(In-between Ethnicity: A socio-anthropological study of ethnic identity of Sinhalese and Veddas)

**ප්‍රභාත් ගලගමගේ**[4]
B.A(sp), M.A, M. Phil, PhD (Reading)
gprabath@gmail.com

**සාරාංශය**

වැදි ජනයා යනු සිංහල ජනයාගේ කොටසක්ද නැතිනම් වෙනම අනන්‍යතා කණ්ඩායමක්ද යන්න ශාස්ත්‍රාලයීය තලයේ මෙන්ම සාමාන්‍ය ජන විවාදයන් තුළද නිතර මුණගැසී ඇති හා මුණ ගැසෙන ප්‍රශ්ණයකි. මෙම පත්‍රිකාව ඔස්සේ මාන කිහිපයකින් වැදි-සිංහල මිශ්‍රණයේ ස්වාභාවය පිළිබඳව සාකච්ඡා කෙරී ඇත. එහිදී දැකගත හැකි කාරණය වන්නේ සිංහල-වැදි මිශ්‍රණය ඔස්සේද වැදි අනන්‍යතාව ප්‍රතිනිෂ්පාදනය වන බවයි.

**ප්‍රමුඛ පද:** වැදි ජනයා, සිංහල ජනයා, අනන්‍යතාව, ජනවාර්ගිකත්වය, මිශ්‍ර විවාහ

## ප්‍රවේශය

ජනවාර්ගික කණ්ඩායමක් (ethnical group) ලෙස වැදි ජනයා හැදින ගත හැකිද යන්නද වැදි ජනයා පිළිබඳ අධ්‍යයනයේදී පැන නගින ගැටළුවකි. Seneviratne (1983) අවධාරණය කරනුයේ - වැද්දන් වෙන්වූ අනන්‍යතාවක් සහිත ජන-සංස්කෘතික කණ්ඩායමක්ද (ethno-cultural) - යන්න අපගේ ඓතිහාසික, සමාජීය, සංස්කෘතික තලයේ මතු නොව, ශාස්ත්‍රාලීය තලයේ පවා සිත්ගන්නා සුළු ප්‍රශ්ණයක් වන බවයි. ඔහුගේ අදහස වන්නේ වැද්දන්ට ඔවුන්ගේම ආචාර ධර්ම පද්ධතියක් හා වෙනත් සමාජ, ආර්ථික, හා දේශපාලනික අන්තර් ක්‍රියාවන් සිය වනගත වාසභූමිය

---

[3] Paper presented at the 6th Annual General Research Conference - Royal Asiatic Society of Sri Lanka

තුළ පැවතිනු බවයි. එනිසා ඔවුන් අනෙකුත් සියළු ජන-සංස්කෘතික මූලයන් සැලකුවේ "ආගන්තුක" ලෙසිණි (Seneviratne 1983). වැදි ජනයා ප්‍රධාන භාෂා භාවිතාවෙන් වෙනස්වූ භාෂාවක් භාවිතා කරනු ලැබූ / ලබන අතර, ප්‍රධාන ජනවාර්ගික කණ්ඩායම් වලට (මෙහිදී මූලික ලෙස අවධාරණය යොමු කරන්නේ සිංහල ජන වර්ගය කේන්ද්‍රිතව වේ. නැගෙනහිර වෙරළබඩ මුහුදු වැදි ප්‍රජාව සම්බන්ධයෙන් ගන්නා විට මෙම අවධානය දෙමළ ජනවර්ගය දෙසට කේන්ද්‍රිත වනු ඇත) වෙනස් වූ ආඛ්‍යානයන්, අභිචාර, ජීවන විලාසිතාවන් දරා සිටිනු දැකිය හැක. එයට ඔවුන්ගේ ඥාතීත්ව රටාව මෙන්ම ආගමික දිශානතියද අයත්ය.

මෙම වෙනස්කම් සිංහල ජනයා වෙතින් සාපේක්ෂ වෙනසක් වන නමුත් ඒවා ප්‍රධාන ප්‍රවාහයෙන් පැහැදිලිවම කැපී පෙනෙයි. අනෙක් අතට සිංහල කුළ ධූරාවලියෙන් පිටත ස්ථාපිතව පැවතීම (Brow 1978) වැදි ජනයා වෙනම ජනවාර්ගික අනන්‍යතාවකට ඇතුළත්කර හැදින ගැනීමට රුකුලකි. එහෙත් Brow (1978) ම මෙම අනන්‍යතා ගැටළුව පිළිබඳව සාකච්ඡා කරමින් සටහන් කරන්නේ ඔහු විසින් විමර්ෂණය කරන ලද රචනාවන් ඔස්සේ මේ පිළිබඳව පැහැදිලි නිගමනයකට ඒම අපහසු බවයි. විවිධ පර්යේෂකයන් මෙම කාරණය පිළිබඳ පොදු එකගතාවකට පැමිණ තිබෙණු දැකගත නොහැක. සමහර පර්යේෂකයින් වැදි ජනයා සිංහල ජනවාර්ගිකත්වය තුළ ස්ථාපිත කර හැදිනගැනීමට ආසක්ත වන විට තවත් පිරිසක් ඒ පිළිබඳව එකග නොවෙති. මෙය සංකීර්ණ කාරණයක් වීම මෙම විවාදාත්මක තත්වයට ප්‍රධාන හේතුවයි.

වෙනස්කම් පමණක් නොව වැදි ජනයා හා සිංහල ජනවාර්ගිකත්වය ඉතා දැඩි අන්තර් සබැදියාවකින්ද යුතුය. දෙපිරිස අතර පොදු ලක්ෂණ රැසක් අන්තර්ගතය. දක්ෂ දඩයක්කරුවන් වූ වැදි ජනයා රාජකීය ගෘහයන්ට මස් සැපයූ (Wijesekera 1982: 13), සිංහල රජුගේ හමුදාව නියෝජනය කළ, සිංහලන් සමග අවාහ විවාහවූ පිරිසකි. එමෙන්ම ඔවුන්ගෙන් බොහෝ කොටසක් දූරාතියේදීම සිංහලකරණයට ලක්වූ බවට සාධක පවතියි (ඔබේසේකර 2007). දෙපිරිසේම පොදු ඇදහීම පිළිබඳ මිත්‍යාවන් පවා අන්තර් සම්බන්ධිතය. පොදු ආගමික හා අභිචාර පිළිවෙත් ද හඳුනාගත හැක. මහියංගන බෞද්ධ පූජස්ථානය සමග ඔවුන් ඓතිහාසිකව බැදී ඇත. එහිදී ඔවුන් රග දක්වන අභිචාරාත්මක අංගයන් ප්‍රකටය. ඔවුන් රජයේ උසස් නිළතල දැරූ බවට ද සාක්ෂි හමුවෙයි. කුල ස්ථරායනයට පිටතින් පිහිටන බවට කියවුනද සිංහලයන් විසින් ඔවුන් ඉහල ස්ථරායන මට්ටමක ස්ථානගතකර හැදින ගෙන ඇත.

මෙම පත්‍රිකාව ඔස්සේ අධ්‍යයනයට ලක් වන්නේ වැදි ජනයාගේ මිශ්‍ර විවාහයන් හා ඒ ඔස්සේ ගොඩනැගෙන ජනවාර්ගික හැඩතලයන්ය. වැදි ජන ජනවාර්ගික සවිඥාණකත්වය අද දින ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ විමසීමක් හා වැදි බව නිර්වචනයන් ඒ හා සමගාමීව වෙනස් විය යුතුය යන අදහස ද පත්‍රිකාව තුළින් සාකච්ඡා කෙරී ඇත.

## අධ්‍යයන ප්‍රදේශය හා ක්‍රමවේදය

මෙම පත්‍රිකාවට පාදක අධ්‍යයනය දඹාන හා හෙන්නානිගල ප්‍රදේශ ඇසුරින් සිදුකොට ඇත. දත්ත රාශිකරණය සඳහා සම්මුඛ සාකච්ඡා හා සහභාගිත්ව නිරීක්ෂණය යන පර්යේෂණ ශිල්ප ක්‍රම යොදාගෙන ඇත. විශේෂයෙන්ම අධ්‍යයනය ඔස්සේ මෙම ආදිවාසී ගම්මානවල ජනයාගේ පවුල් ඉතිහාසයන් පිළිබඳව වැඩි අවධානයක් යොමුකර ඇත. එසේම මැතිවරණ ගැසට් පත්‍ර හා වෙබ් මාධ්‍ය භාවිතයෙන් කල සෙවුම් ඔස්සේ පෙළපත් නාමයන්ගේ විසිරීම් රටා අධ්‍යයනයට ලක්කර ඇත. අධ්‍යයනයට අදාල පදනම් දැනුම සඳහා විෂයය ක්ෂේත්‍රය හා අනුබද්ධිත සාහිත්‍ය පරිශීලනය කර ඇත .

[4] දර්ශනපති උපාධි අපේක්ෂක, ආදිවාසී ජන අධ්‍යයන කේන්ද්‍රය, සබරගමුව විශ්ව විද්‍යාලය

## හේරත් මුදියන්සේලාගේ උක්කුබණ්ඩා හා ඌරුවරිගේ සුදු මැණිකා - ”වැදි” බව හා ”සිංහල” බව අතර දෝලනය

සිංහල බව හා වැදි බව අතර සබඳතාවය ඔබේසේකර (2007) දක්වන්නේ, වැදි ජනයා සිංහල බවට මෙන්ම සිංහල ජනයා වැදි බවටද පත්වීම ද, සිදුව ඇති බව පෙන්වා දෙමිණි. වැදි ජනයා හා සිංහල ජනයා විවාහ සබඳතා ඔස්සේ මිශ්‍රවීම පිළිබඳ සාධක රැසක් දඹාන ප්‍රදේශයේදී මුණගැසේ. මෙම මිශ්‍රණයන්ට දිගු ඉතිහාසයක් ද පවතින බව පෙනේ. මන්ද අද දිවි ගෙවන පරම්පරාවට මෙම මිශ්‍රණය සිදුවූ මුල් පරම්පරා පිළිබඳ මතකයක් නොමැති හෙයිණි. නමුත් නිරීක්ෂණය කලහැකි ප්‍රධාන විශේෂත්වයක් වන්නේ දැඩි ලෙස කුලමය ස්ථරායනයක් දරන සිංහල සමාජය තුලින් හෝ වැදි සමාජය තුලින් මෙම මිශ්‍රණයන්ට දෘඩ ප්‍රතිරෝධයක් ජනනය නොවීමයි. අළුතින් මිශ්‍ර විවාහ කරගත් බොහෝ දෙනා පැවසුවේ සිය විවාහයන් සඳහා සිය නිවෙස් වලින් හෝ ප්‍රජාවෙන් විරෝධයක් නොපැමිණි බවයි. එහෙත් සාමාන්‍ය සිංහල සමාජය විවාහයේදී කුලය ප්‍රධාන සාධකයක් ලෙස තවමත් සලකනු ලබයි.

දඹාන වැදි ජනයාගේ මිශ්‍රණයන් අනාවරණය වන්නේ පෙළපත් නාම හරහාය. ප්‍රදේශයේ වෙසෙන සැලකිය යුතු පිරිසකට පවතින්නේ වරිග නාමයන් නොව සිංහල පෙලපත් නාම කිහිපයකි. මෙම පෙලපත් නාමයන් ගේ විශේෂත්වය වන්නේ ඒවා මුදියන්සේලාගේ යන්නෙන් අවසන් වීමයි. මෙම පෙලපත් නාමයන්ම හෙන්නානිගල පදිංචි ප්‍රජාව අතරද විසිරී ඇත. ඒ ඔවුන්ගේ ද මුල් භූමිය මෙම ප්‍රදේශය වන නිසාවෙනි.

හේරත් මුදියන්සේලාගේ

දිසානායක මුදියන්සේලාගේ

රඹුක්වැල්ලේ මුදියන්සේලාගේ

නාරායන මුදියන්සේලාගේ

අත්තනායක මුදියන්සේලාගේ

මෙකී පෙලපත් නාමයන් මගින් සිංහල ගොවි කුලයද, ඒ සමඟම උඩරට ඉහල කුල පසුබිමක්ද සංඥා කෙරේ. මෙම පෙලපත් නාමයන් සහිත සිංහල පිරිස් මහියංගනය, මහනුවර හා බදුල්ල හා බිබිල ආදී ප්‍රදේශන්හිදී හමුවෙයි. උදාහරණ ලෙස යම් ප්‍රදේශයක ආධිපත්‍ය දරන ප්‍රමුඛ කුල කණ්ඩායම හඳුනා ගත හැකි එක් ප්‍රධාන අවස්ථාවක් වන මැතිවරණ අපේක්ෂක ලැයිස්තුව ගතහොත්, බදුල්ල මහනගර සභාවේ අපේක්ෂකයින් ගෙන් සැලකිය යුතු ප්‍රමාණයක් (හේරත් / දිසානායක / රත්නායක ...) මුදියන්සේලාගේ යන පෙලපත් නාම දරයි. මහනුවර හා මහියංගන ප්‍රදේශයේ ද මෙම පෙලපත් නාමය විසිරී ඇත. දඹාන ප්‍රදේශයේ දක්නට ඇති මුදියන්සේලාගේ පෙලපත් නාම අතරින් බහුතරය අයත්වන්නේ ”හේරත් මුදියන්සේලාගේ” යන්නටයි[5]. මෙවැනි මිශ්‍රණයන් පිළිබඳ උදාහරණ කිහිපයක් සලකා බලමු.

> හේරත් මුදියන්සේලාගේ සිරියාවතී (දත්ත දායකයා) සිය පරම්පරාව මතකයට නගන්නේ සිය සීයා හේරත් මුදියන්සේලාගේ පෙළපත් නාමය සහිත බව පවසමිනි. සිය මිත්තනිය ආදිවාසී සම්භවයක් සහිත බව හෝ නොමැති බවට ඇයට මතකයක් නැත. ඇයගේ මව ආදිවාසී වරිග නාමයක් දරන්නියක විය. නායකවරයා ඥාතීත්වයෙන් මාමා කෙනෙක් වන

[5] පිරිසක් පවසන්නේ මෙම මුදියන්සේලාගේ පෙලපත් දවන ලෝක යුධ සමයේදී ප්‍රදේශයට පැමිණි අයගෙන් පැතෙන බවයි. එහෙත් මේ පිළිබඳවද නිශ්චිත සාක්ෂි නැත.

බව අය දක්වයි. ඇය විවාහ වී සිටිනුයේ මහියංගන නගරයෙන් හමුවූ සිංහල පුද්ගයෙකු සමඟය.

ඌරුවරිගේ ගුණතිලක (දත්ත දායකයා) සමග විවාහ වී සිටින නාරායන මුදියන්සේලාගේ ආරියලතා (දත්ත දායකයා) ගේ පාරම්පරික වාස භූමිය දඹාන ප්‍රදේශයයි. ඇයගේ සීයාද දඹාන ප්‍රදේශයේම බව ඇයට මතකයක් ඇත. නමුත් ඇයගේ පරපුර හා ආදිවාසී පරපුර අතර ඥාතීත්ව සබඳතා පැවති බවට මතකයක් ඇයට නැත.

හේරත් මුදියන්සේලාගේ කුමාරදාස (දත්ත දායකයා) විවාහ වී සිටිනුයේ මොනාර වරිගේ සුමනාවතී සමගිනි. ඔහුගේ මව මොනාර වරිගේ පුංචි මැණිකාය. මව් පියන්ගෙන් ඔබ්බට පවුල් ඉතිහාසයක් ඔහුට මතකයට නැගිය නොහැක.

හේරත් මුදියන්සේලාගේ රුවන්ගේ (දත්ත දායකයා) මව උනාපාන වරිගේ මුතු මැණිකාය. රුවන් විවාහ වී සිටින්නේ හේරත් මුදියන්සේලාගේ ශ්‍රියාණි සමගිණි. ඇයගේ මවද වරිග නාමයක් දරන ආදිවාසී තැනැත්තියකි.

හේරත් මුදියන්සේලාගේ රත්නායක (දත්ත දායකයා) ගේ පියා උක්කු බංඩාය. මව ඌරුවරිගේ සුදුමැණිකාය. ඔහුගේ සහෝදර සහෝදරියන් පස්දෙනොම විවාහ වී සිටින්නේ වරිගයේම අය සමඟය. ඔවුන්ගේත් දරුවන් රැකියාවන් සඳහා කොළඹ හා කුරුණෑගල වැනි ප්‍රදේශ වලට ගොස් සොයාගත් සහකාරියන් හා සහකරුවන් සමඟ විවාහ වී ඇත. ඔවුන්ද පදිංචි වී සිටිනුයේ දඹාන ප්‍රදේශයේමය.

හේරත් මුදියන්සේලාගේ දයාවතී හා හේරත් මුදියන්සේලාගේ ගුණසේකර, හේරත් මුදියන්සේලාගේ දයාරත්නගේ (දත්ත දායකයා) දෙමව්පියන් වේ. ඔහු දන්නා පරිදි ඔහුගේ මව් පියන්ගේ මව්පියන්ද ජීවත්ව ඇත්තේ දඹාන ප්‍රදේශයේය. සිය පියාගේ දෙවන විවාහය ඌරුවරිගේ සුදුමැණිකා සමගය. එසේම ඔහුගේ ඥාතීන් ද ආදිවාසීන් සමඟ විවාහ වී ඇත.

දඹාන ප්‍රදේශයේ (හා හෙන්නානිගල ප්‍රදේශයේ එයට අඩුතර වශයෙනුත්) මෙම මුදියන්සේලාගේ පෙළපත් නාම මිශ්‍රණය දැකගත හැකි අතර, මෙම මිශ්‍රණයන් හරහා වැදි ජනයාගේ වරිග නාම යම් මට්ටමකින් ඉවත් වීම සිදුව ඇත. එහෙත් අධ්‍යයනයේ දී අනාවරණය වන රටාව වන්නේ මෙම පෙලපත් නාම හා වරිග නාම අතර නිරන්තරව විවාහයන් සිදුවන බවයි. ඒ ඔස්සේ වරිග නාම හා මුදියන්සේලාගේ පෙළපත් නාම නිරන්තරව මිශ්‍ර වෙමින් ආදිවාසී ප්‍රජා අනන්‍යතාව තිරසර වන වනබව පෙනේ. බාහිර සිංහල ප්‍රජාව සමඟ විවාහයන් සිදුව ඇත්තේ එයට අඩු මට්ටමිණි. එම බාහිර සිංහල ප්‍රජාව සමඟ වන විවාහයන් ද වැඩි වශයෙන් සිදුව ඇත්තේ ද සිංහල මුදියන්සේලාගේ පෙළපත් නාමයන් සමගය.

කෙසේ වෙතත් සිංහල හා ආදිවාසි මිශ්‍රණයන් මෙම පෙළපත් නාමයට සීමා වී නැත. උදාහරණ ලෙස දඹාන ප්‍රදේශයේදී සම්මුඛ සාකච්ඡාවට ලක්වූ මල්ගහවිල විජේරත්න පැමිණ සිටියේ සිය ලොකු තාත්තා කෙනෙකු වන දඹාන විදුහලේ විදුහල්පති ලෙස කටයුතු කල ඌරුවරිගේ පුංචි බණ්ඩාගේ නිවසටයි. ඔහුට දඹානට පවතින සම්බන්ධය නිසිලෙස විස්තර කල නොහැක. ඔහු පවසන්නේ "අප්පච්චිලගෙ පැත්තෙන් වන්නියලැත්තෝ නෑදැයෝ. ලොකු තාත්තත් අප්පච්චිලගෙ පැත්තෙන් නෑදැයෝ. එච්චරයි මම මේ ඥාති සම්බන්ධතා ගැන දන්නෙ" යනුවෙනි. ඔහුගේ පියා මල්ගහවෙල සුදුබණ්ඩා වන අතර සොරබොර ගෙදර පලිගු මැණිකා මවගේ නමයි. ඔවුන්ගේ පදිංචිය දඹානට කිලෝමීටර කිහිපයක් එපිටිනි. තවත් උදාහරණයක් ගතහොත් යස්සන්

තිසාහාමිගේ පියා සිංහල වන විට මව ඌරුවරිගේ සුදු මැණිකා වේ. දඹාන නායක වරයා ඥාතීත්වයෙන් ඔහුගේ මස්සිනා කෙනෙකු වේ. ගම්පහ ප්‍රදේශය මුල් ගමවන සිය පියාගේ නම ගල්බොක්කේ කේ. ජේම්ස් බවත් මව ඌරු වරිගේ ලොකු මැණිකා බවත් පවසන ගල්බොක්කේ කේ. විපුල් වසන්ත, නම දෙනෙකු වන සිය පවුලේ අය වරිගේ අය හා සිංහල අය යන දෙපිරිසම සමඟ විවාහ වී ඇති බව දක්වයි. ඔහු විවාහ වී සිටින්නේ බදුල්ල ප්‍රදේශයේ සිට දඹාන ආසන්නයේ පදිංචියට පැමිණ ඇති පවුලකට අයත් රත්නායක මුදියන්සේලාගේ පුංචිමැණිකාය සමගිනි. මේ ආකාර ඥාති සබඳතා රැසක් දඹාන ප්‍රදේශයෙන් සපයා ගත හැක. විශේෂයෙන්ම නව පරම්පරාව සිය ඓතිහාසික මිශ්‍රණයක් වන මුදියන්සේලාගේ පෙලපත් නාමයට බාහිරින් මුසු වීම යම් මට්ටමකින් දැකගත හැක. දඹාන විදුහලේ විදුහල්පතිව සිට විශ්‍රාම ලැබ සිටින ඌරුවරිගේ පුංචි බණ්ඩා විවාහ වී සිටින්නේ සිංහල කාන්තාවක් සමගය. දරුවන් සිව් දෙනාගෙන් තිදෙනෙක් සිංහල පුද්ගලයින් සමඟ විවාහකය. එක් දියණියක් උනාපානවරිගේ ගුණරත්න නැමති ආදිවාසී පුද්ගලයෙකු සමඟ විවාහකය.

බාහිරින් නිරීක්ෂණය කරන විට විවාහයන් ඔස්සේ සිංහල සමාජය තුළට වැදි සමාජය දියව යාමේ ප්‍රවනතාවක් ඇතැයි යන සැකය ඇතිවීමේ ඉඩකඩක් ඇත. එහෙත් මෙම ඥාතීත්ව ව්‍යුහයන් ගේ හැසිරීම් රටාව ඉස්මතු කරන්නේ එයට වෙනස් අදහසකි. එනම් ඔවුන් බාහිර සිංහල සමාජයට මිශ්‍ර වුවද නැවත වරිග නාමයන් හා මිශ්‍ර වීමේ ප්‍රවනතාව ඉහළ බවයි. තවදුරටත් පැහැදිලි කරන්නේ නම් ඔවුන්ගේ ඉදිරි පරම්පරාවන් විවාහයන් ඔස්සේ නැවත වරිග නාම සහිත පුද්ගලයන්ට සම්බන්ධ වීමේ ප්‍රවනතාව ඉහළය. විවාහය ඔවුන්ගේ ඥාති සබඳතා අතහැරෙන ලක්ෂයක් නොවන බව මේ අනුව පැහැදිලිය.

පවුල් ඉතිහාසයන් හා ඥාතීත්ව ව්‍යුහයන් අධ්‍යනයේදී දැකගත හැකිවූ තවත් කාරණයක් වන්නේ ඔවුන් සමහර අවස්ථාවලදී මවගේ පෙළපත් නාමය ද සිය පෙළපත් නම ලෙස භාවිතා කරන බවයි. උදාහරණ ලෙස ඉහත දක්වා ඇති ගල්බොක්කේ කේ. විපුල් වසන්තගේ මල්ලී වන විජේතුංග භාවිතා කරන්නේ ඌරුවරිගේ විජේතුංග ලෙස සිය මවගේ වරිග නාමයයි. මෙයට එක් හේතුවක් වන්නේ මව්පියන් නීතියෙන් විවාහ නොවීමයි. උදාහරණක් ලෙස උනාපානවරිගේ මුතුමැණිකා හා ඇයගේ සහෝදර සහෝදරියන් භාවිතා කරන්නේ ඌරුවරිගේ ලෙස වන පියාගේ වරිග නාමය නොව මවගේ වරිග නාමයයි. සිය පියාගේ පෙලපත් නම නොදන්නා හේරත් මුදියන්සේලාගේ සුදත් චන්දන සිය පෙලපත් නම ලෙස භාවිතා කරන්නේ සිය මව වන හේරත් මුදියන්සේලාගේ සේපාලිකා ගේ පෙළපත් නාමයයි. ඔහු විවාහවී සිටිනුයේ ඌරුවරිගේ සීතා දමයන්ති සමගිණි.


කෙසේ වෙතත් ඓතිහාසික සබඳතාවක් ඇති, බොහෝ විට මුල් ආරම්භයන් පිළිබඳ ඉතිහාසයන් වියැකී ගොස් ඇත මුදියන්සේ පෙළපත් නාමයන් වැදි සමාජය සමහර අවස්ථාවලදී සලකන්නේ බාහිර නාමයන් ලෙසයි. උනාපානවරිගේ මුතු මැණිකා සිය පවුල් ව්‍යුහය විස්තර කරමින්

> "මට මල්ලිලා දෙන්නයි, අයියලා තුන් දෙනයි, අක්කලා හතර දෙනෙකුයි ඉන්නවා. ඒ ගොල්ලො සිංහල කට්ටියත් එක්කත් විවාහ වෙලා ඉන්නවා. හේරත් මුදියන්සේලාගේ පුෂ්ප කුමාරී, දිසානායක මුදියන්සේලාගේ සෝමාවතී, තෝරෙහේනෙගෙදර යශෝමැණිකා ඒ අයගේ නම්. ඔවුන්ටත් දරුවන් ඉන්නවා. ඔවුන් අතරින් කොටසක් ආදිවාසී අය සමඟ විවාහකයි"
>
> "මගේ නම ඌරුවරිගේ විමලාවතී. මගේ දුව විවාහවෙලා ඉන්නේ සිංහල එක්කෙනෙක්. එයා හේරත් මුදියන්සේලාගේ..."

මේ අනුව මුදියන්සේලාගේ යන පෙලපත් නාමය "සිංහල නාමයක්" ලෙස හඳුන්වාදීම සම්මුඛ සාකච්ඡාවන් තුළදී බහුලව දැකගතහැකි කාරණයක් විය. මෙම නාමයන් හමුවේ වරිග සභාව වැනි සම්ප්‍රදායන් තුළට ඇතුළත්වීමේ ගැටළු වලටද ඔවුන් මුහුණ දෙන බව පෙනේ. නමුත් දැකගතහැකි කාරණය වන්නේ මෙම පෙලපත් නාමය වැදි ප්‍රජාව හා මිශ්‍රවීම දිගු ඉතිහාසයකට හිමිකම් කියන බවයි. අනෙක් කාරණය, ආදිවාසීන්ගෙන් සැලකිය යුතු පිරිසක් මෙම පෙලපත් නාම දැරීමයි. මෙම පෙළපත් නම් ඔස්සේ ඔවුන්ගේ ඥාතීත්ව සබඳතා බදුල්ල ප්‍රදේශයේ සිට මහියංගන ප්‍රදේශය දක්වාම විහිදෙන බවද පෙනේ.

> "මගේ තාත්තා තොරහේනෙගෙදර අප්පුහාමි. අම්මා දිසානායක මුදියන්සේලාගේ සුදුකුමා. මට විතරක් අම්මගේ වාසගම වැටිලා තියෙනවා. අපේ පවුලේ අනික් දස දෙනාට අප්පච්චිගෙ වාසගම. අපි පංදිංචි වෙලා හිටියෙ මහියංගනයේ 48 ප්‍රදේශයේ. මගේ සැමියා උනාපානවරිගේ නිමල්. අපේ එක දරුවෙක් විවාහකයි. එයාගෙ නෝනගෙ නම උනාපාන වරිගේ අනුලාවතී.
>
> "මගේ නම උනාපානවරිගේ ජයතිස්ස. නෝනගෙ නම රත්නායක මුදියන්සේලාගේ සෝමාවතී. එයාගෙ ගම මහියංගනේ."

මෙලෙස සිදුවන විවාහයන් අරඹයා දෙපාර්ශවයෙන්ම විරෝධයක් එල්ල නොවන බව සම්මුඛ සාකච්ඡාවන්ට බඳුන් කල සියළු දෙනා සඳහන් කිරීම විශේෂත්වයකි. මෙය සිංහල සමාජය වැදි සමාජය කුල ධූරාවලියේ ඉහල ස්ථානයක ස්ථානගත කිරීමේ ප්‍රතිඵලයක් ලෙස හැඳින ගත හැක. කෙසේ වුවත් සිංහල සමාජය වැදි බව සලකන්නේ "පසුගාමී" අර්ථයෙන් වන හෙයින් මෙම විවාහයන් පංතිමය ස්ථරායනයේ අසමාන කොටස් අතර සිදුවන විවාහයන් නොව සිංහල පහල ස්ථර සමඟ වන විවාහයන්ය. සිංහල මධ්‍යම පංතිය විවාහයන් ඔස්සේ වැදි සමාජය විනිවිදිණු දැකගත හැකි වන්නේ ඉතා කලාතුරකිනි.




**නිරූපන අංක 01:** ඥාතීත්ව සබඳතා ජාලයේ පැවැත්ම

## නිගමන

ඉහත විශ්ලේෂනයන් ඔස්සේ නිගමනය කළ හැක්කේ මුදියන්සේලාගේ පෙලපත් නාම හා වරිග නාම ද අනෙකුත් "ආගන්තුක" පෙලපත් නාම හා වරිග නාම ද නැවත නැවතත් මිශ්‍ර වෙමින් පවතින බවයි. මේ අනුව විවාහයන් ඔස්සේ මෙම පෙලපත් නාම හා වරිග නාමයන්හි අඛණ්ඩත්වයක් පැවතෙනු ලබයි. විවාහයන් ඔස්සේ බාහිරට සිදුවන ගලායෑම එතරම් විශාල නොවේ. එසේ බාහිරට ඇතිවන ගලායෑම් වලින් කොටසක් ද නැවත විවාහයන් ඔස්සේ වැදි ප්‍රජාව වෙතම එකතුවනු දැකගත හැක. අනෙක් කාරණය වන්නේ සිංහල පුද්ගලයින්, විවාහ ඔස්සේ වැදි

සමාජයට ඇතුළු වන වේගයට සාපේක්ෂව වැදි ජනයා විවාහයන් ඔස්සේ වැදි සමාජයෙන් බැහැර වීම අවම බවයි. මෙම තත්වය පැහැදිලි කරන්නේ මිශ්‍ර විවාහයන් මගින් සිදුව ඇත්තේ වැදි අනන්‍යතාව ප්‍රති නිශ්පාදනයක් මිස අනන්‍යතාව හෝ ජනවාර්ගික හැගීම බැහැර කරලීමක් නොවන බවයි. ඔවුන් ඥාතීත්ව ජාල හරහා වඩ වඩා වැදි අනන්‍යතාව තුලට ඇතුළු වෙයි. වැඩි ප්‍රමාණයක් විවාහ දැකගත හැක්කේ ඥාතීත්ව ජාල ඇතුලත මිස පිටත නොවේ. මිශ්‍ර විවාහයන් හේතුවෙන් වැදි ජනයා හැදින ගැනීමේ දී වරිග නාම හෝ සම්ප්‍රදායික ආදිවාසී නාමයන් මත යැපීමේ හැකියාවක් වර්ථමානයේ උදානොවේ. එසේම වැදි අනන්‍යතාව නිර්වචනය කල යුත්තේ සම්ප්‍රදායික වාර්ගික (race) දැක්මෙන් නොව ජනවාර්ගික (ethnic) අනන්‍යතාව පිළිබඳ මූලධර්ම ඔස්සේයි.

මේ නිසා අප වැදි බව පිළිබඳ අනන්‍යතා රේඛාවන් ප්‍රති නිර්වචනයකට කල යුතුව ඇත. මේ සඳහා මා යෝජනා කරන්නේ තමා ආදිවාසී / වැදි බව පිළිගන්නා හෝ ඒ පිළිබඳව සවිඥාණික හෝ ඒ පිළිබඳව ව්‍යංගර්ථයෙන් ප්‍රකාශයට පත්කරන හෝ එම සමාජයට අන්තර්ග්‍රහණය වී දිවිගෙවන පුද්ගලයින් ආදිවාසී / වැදි අනන්‍යතාවෙන් හදුනාගත යුතු බවයි.

මෙම තත්වය වැදි ජනයාගේ වියැකීයෑම / නෂ්ටවීම පිළිබඳ සාමාන්‍ය සමාජීය මතය ද ප්‍රශ්ණ කරයි. මන්ද වැදි ජනයාගේ හෝ වෙනයම් ජනවාර්ගික හැගීමක් හෝ අප සිතන තරම් පහසුවෙන් වෙනස්වීම සිදු නොවන බව ඔවුන්ගේ ඥාතීත්ව රටාවේ වෙනස්කම් අධ්‍යයනයේ දී පැහැදිලි වන හෙයිණි.

## ප්‍රධාන ආශ්‍රිත මූලාශ්‍ර

**මුද්‍රිත ග්‍රන්ථ - ඉංග්‍රීසි**


Brow, James (1978). Vedda Villages of Anurapura – The Historical Anthropology of a Community in Sri Lanka. London: University of Washington Press

Davy, John (1983) (First published 1821). An Accouni of the Interior of the Ceylon and of its Inhabilants with travels in that Island. Dehiwala: Tisara Prakasakaya Ltd.

Dharmadasa, K. N. O (1990). The Veddas struggle for Survival: Problems, Politics and Responses. In K. N. O Dharmadasa and S. W .R de A. Samarasinghe (ed) The Vanishing Aborigines – Sri Lanka's Vedda in Transition. Colombo. International Centre for Ethnic Studies

Meegaskumbura, P.B (1990). Religious beliefs of the Veddas in Relation to their world-view. In K. N. O Dharmadasa and S. W .R de A. Samarasinghe (ed) The Vanishing Aborigines – Sri Lanka's Vedda in Transition. Colombo. International Centre for Ethnic Studies.

Obeyesekere, Gananath (2003). Form aristocrats to primitives. IIAS Newsletter – March. International Institute for Asian Studies

Obeyesekere, Gananath (2004). The Väddas: representations of the wild man in Sri Lanka . In Jacob K. Olupona (ed) Beyond Primitivism (pp 272-293) . Routledge

Parker, H 1992 (first published (1909). Ancient Ceylon. New Delhi: Asian Educational Service

Seligmann, C.G and Branda Z. Seligman (1911) . The Vaddas. Cambridge University Press.
(reprint 1993 by Navrang Publisher, New Delhi)

Seneviratne, Sudharshan (1983). The Curse of Kuveni: The Vedda and the Anti-thesis of Modernization. Lanka Guardian - Vol. 6

Silva, C. R De (1990). The Vedda and His Mentors: Some Theoretical and Methodological Considerations. In K. N. O Dharmadasa and S. W .R de A. Samarasinghe (ed) The Vanishing Aborigines – Sri Lanka's Vedda in Transition. Colombo. International Centre for Ethnic Studies

Silva, Premakumara De (2011). The Veddas of Sri Lanka. The Island – 10th August

Siriwardena, Regi (2004). Identity-Talk, and tales my mother told me. Colombo. International Center for Ethnic Studies

Wijesekera, Nandadeva (1982). Vanishing Veddas. Journal of Royal Asiatic Society (Sri Lanka) - vol- XXVI. Colombo. Royal Asiatic Society of Sri Lanka.

Wijesekera, Nandadeva (1964). Vaddas in Transition. Colombo. M.D Gunasena and Company Ltd

**මුද්‍රිත ග්‍රන්ථ - සිංහල**

ඔබේසේකර, ගණනාත් (2007). වැද්දෝ සියල්ල කොයිබට ගියෝද? ශ්‍රී ලංකාවේ බුද්ධාගම හා ආදිවාසිකත්වය (පරිවර්තනයඃ අනුරුද්ධිකා කුලරත්න). ශ්‍රී ලාංකේය සමාජය සහ සංස්කෘතිය පාඨනය කිරීමඃ තෝරාගත් නිබන්ධ - පළමු වෙළුම. සමාජ සංස්කෘතික තීව්‍ර අධ්‍යයනය සඳහා වන කොළඹ ආයතනය

රත්නපාල, ඊ. ඇම් (2003). ලංකාවේ වැද්දෝ. ආරිය ප්‍රකාශකයෝ. වරකපොල

සෝමදේව, රාජ් (2011). ඉතිහාසය දෙස විසංයෝජනීයව බැලීම. රාවය - ජූලි 31.

තංගරාජා, යුවරාජ් (2007). ශ්‍රී ලංකාවේ නැගෙනහිර වෙරළබඩ වැද්දන් අතර හානිපත් බව පිළිබඳ අඛ්‍යාන ජනවාර්ගික අනන්‍යතාව ලෙස (පරිවර්තනයඃ අනෝලි පෙරේරා). ශ්‍රී ලාංකේය සමාජය

සහ සංස්කෘතිය පාඨනය කිරීම: තෝරාගත් නිබන්ධ - දෙවන වෙළුම. කොළඹ. සමාජ සංස්කෘතික තීව්‍ර අධ්‍යයනය සඳහා වන කොළඹ ආයතනය

**මාර්ග ගත - ඉංග්‍රීසි (online: English)**

Ratcliffe , Peter (2010). Ethnic Group . A joint publication of the International Sociological Association (ISA) and SAGE
Available online at http://www.isa-sociology.org/publ/sociopedia-isa/

Yazdiha , Haj (2010). Conceptualizing Hybridity: Deconstructing Boundaries through the Hybrid . Formations: The Graduate Center Journal of Social Research - Vol.1 No.1 . Sociology Students Association, CUNY Graduate Center. The City University of New York
Availiable on line at http://ojs.gc.cuny.edu/index.php/formations/index

**මාර්ග ගත - සිංහල (online - Sinhala)**

සෙනෙවිරත්න, සුදර්ශන් (2009). අතීතය පෙළගැස්වීම සහ වර්තමානය යුක්තියුක්තකරණය; පුරාවිද්‍යාවේ දේශපාලනය. archaeology.lk
www.archaeology.lk හි මාර්ගගතව ඇත.

සෝමදේව, රාජ් (2011). ජාතික ඉතිහාසය නව සුසංවාදයක් දෙසට. archaeology.lk
www.archaeology.lk හි මාර්ගගතව ඇත.